# සදහටම නිහඬවුණු ඒ තාල තරංගය



විජේරත්න රණතුංග මාස්ටර් සිය සුපුරුදු වාද්‍ය භාණ්ඩ සමග



ශ්‍රී ලංකාවේ මෙතෙක් බිහිවූ දක්ෂතම සංගීතඥයින් අතුරෙන් කෙනෙක් පසුගිය සැප්තැම්බර් මස 17 වන දා මෙලොවින් නික්ම ගියේය. ඒ අන් කිසිවෙකු නොව අපේ විජේරත්න රණතුංග නම් විශිෂ්ඨ තබ්ලාවාදකයා ය. ප්‍රවීන සංගීතඥයා ය. දශක හතරක කාලයක් පුරා නින්නාද දුන් ඒ තාල තරංග මාලාව සදහටම නැසී ගොළුවී ගියේ ය.

විජේරත්න රණතුංග මහරගම මධ්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයෙකි. රජයේ සෞන්දර්ය විද්‍යාලයට බැඳී සංගීතය හැදෑරූ ඔහු ඒ පීඨයෙන් තබ්ලා හා ගායනය පිළිබඳව ඉහළ සුදුසුකම් ලබා 1976 දී සංගීත ලෝකයට අවතීර්ණ විය. ලලිත කලා යතනයේදී ඔහුගේ සංගීත ආචාර්යවරයා වූයේ ඒ. ඩී. කොඩිතුවක්කු මාස්ටර්ය. කොඩිතුවක්කු මාස්ටර් එවකට සිටි තබ්ලා ප්‍රවීනයෙකි. එසේම ඔහු එම සෞන්දර්ය පීඨයෙන් වාදනය හැදෑරූ බොහෝ ශිෂයින්ට ගුරුවරයා වූයේය. ඒ වාදනයන් බලා සිටි විජේරත්නයන්ටද හිත ගියේ තබ්ලා වාදනයටය. විජේරත්න පසුව එම භාණ්ඩය සඳහා එවකට ප්‍රකටව සිටි තවත් ප්‍රවීනයන් වූ පී. වී. නන්දසිරි හා ඩී. ආර්. පීරිස් යන මාස්ටර්ලා දෙදෙනාගෙන් ද තබ්ලා වාදන කෞශල්‍යය තවත් ඔප කරගත්තේ ය.

1970-1980 දශකයේදී විජේරත්න ශ්‍රීලංකා ගුවන් විදුලිසංස්ථාවේ වාදක මණ්ඩලයට පිටත සිට පැමිණ වරින්වර සහභාගි වීය. ඔහු එහි මැදිරිවල තබ්ලාව වාදනය කරමින් සහභාගි වුණු ප්‍රසාංගික සංගීතමය සහ වෙනත් ගායනා වැඩ සටහන් බොහොමයක් මම පටිගත කර ඇත්තෙමි. එකල මා ශ්‍රීලංකා ගුවන් විදුලි සංස්ථාවේ කාර්මික ශිල්පියෙකු ලෙස එහි සේවයට බැඳී සිටියෙමි.

විජේරත්නගේ තබ්ලාව රසික ජනතාව විසින් වඩාත් වැළඳ ගනු ලැබුවේ වික්ටර් රත්නායකයන්ගේ **ස** ප්‍රසංගය වේදිකා-වට පැමිණීමත් සමග ය. **ස** ප්‍රසංගය දිවයිනේ අස්සක් මුල්ලක් නැර පළාත්වල නගරවල ශාලා වේදිකාවට පැමිණෙත්ම එම ප්‍රසංගයේ වික්ටර්ගේ ගායනාවලට මෙන්ම විජේරත්නගේ තබ්ලාවට ද රසික යින්ගේ සිත් ඇදී ගියේ ය.

ඔහු වික්ටර් රත්නායක පමණක් නොව විශාරද අමරදේව, විශාරද නන්දා මාලිනී, සිසිර සේනාරත්න, එඩ්වඩ් ජයකොඩි සුනිල් එදිරිසිංහ, මාලිනී බුලත් සිංහළ, ටී. එම්. ජයරත්න ආදී ප්‍රවීන ගායන ශිල්පීන්ගේ සන්දර්ශණ වලට තබ්ලා වයමින් ඔවුන් සමග එක්සත් රාජ ධානිය, ප්‍රංශය, ඉතාලිය, මැද පෙරදිග, ඇමරිකාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව ආදී දේශ දේශාන්තරවල සංචාරයේ යෙදෙමි-න් සිය වාද්‍ය කෞශල්‍යය විදහා පෑවේය.

ප්‍රවීන සංගීතවේදීන් වන ප්‍රදීප් රත්නායක සහ රෝහණ වීරසිංහ සමග විජේරත්න ඇමරිකාවේ සුප්‍රකට ඩිස්නි ලන්තයේ සහ ඕස්ට්‍රේලියාවේ සම්භාවනීය සිඩ්නි ඔපරා ශාලාවල ද සිය කුසලතා ප්‍රදර්ශනය කර ඇත.

1999 දී විජේරත්න තබ්ලා වාදනය ශ්‍රීලංකාවට ගැලපෙන අන්දම විග්‍රහ කරමින් ග්‍රන්ථයක් සම්පාදනය කළේය. එසේම ඔහු තබ්ලා වාදනය ඇසුරෙන් සංගීත සන්ධවනි කීපයක් නිර්මාණය කළේය. ඉන් එකක් වැස්සය. වැස්සක් එන අයුරු හා එය කෙමෙන් පොද වැටෙමින් මහා ධාරානිපාත වැස්සකට පෙරළී, යළිත් කෙමෙන් වැස්ස තුරල් වෙමින් සිහින් පොදකට හැරී සම්පූර්ණ යෙන් නැවතී යන අයුරු වේදිකාවේ මැවූ අයුරු පුදුම සහගතය. පොළවට හීන් වැහි බිංදු වැටෙන හඬ පවා ඔහු ඉතා සියුම් ලෙස තබ්ලාවට නිය පිටින් තට්ටු කර නිපදවූ සැටි ආශ්වාද ජනකය.

එසේම තබ්ලා වාදනය පිළිබඳ විවිධ පර්යේෂණ කළ ඔහු සොයා ගත්තේ උඩැක්කි තම්මැට ආදී අනේක විධ භාණ්ඩ ගණනාවකින් නිකුත් වන විවිධ හඬ මනාව සැකසූ තබ්ලාවකින් ඒ ආකාරයෙන්ම නිකුත් කළ හැකි බව ය.

විජේගේ ආදරණීය බිරිඳ නිර්මලා නමටම සරිලන නිර්මල කටහඬක් ඇති ගායන වාදන විශාරදවරිය කි. ඇය ගයා ඇති ජනප්‍රිය ගී බොහෝ ය. මේ දෙදෙනට නුවන් චාමර නමැති පුතෙක් ද සෙව්වන්දි නම් දුවක් ද සිටිති. නිර්මලා ප්‍රවීන ගායිකාවන් දෙදෙනෙකු වන මල්කාන්ති නන්දසිරිගේ සහ නිරංජලා සරෝජනීගේ සොහොයුරියකි.

විරේරත්න රණතුංග ශ්‍රී ලංකා සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුව සිටියේය. නිවුණු ගති පැවතුම් ඇති කිසිවකට කළබල නොවන එසේම නිරහංකාර මිනිසෙකු වූ විජේරත්න තම කැදැල්ලේ බිරිඳ හා දරු දෙදෙනා සමග නිස්කලංක ජීවිතයක් ගෙවූ කෙනෙකි. ඔහුගේ හදිසි වියෝගය කලා ක්ෂෙත්‍රයට වූ ඉමහත්ම පාඩුවකි. ඔහුගේ වැනි මියුරු තබ්ලා හඬක් යළි කවදා අප අසන්නටද?

මේ මහා වාදකයාණන්ට නිවන් සුව පතමි!

♦ සිසිර චන්ද්‍රසේකර
Edgware Middx UK

# මගේ මතක පොතෙන්....

**වි**ජේරත්න රණතුංග මා මුලින්ම හඳුනාගත්තේ හැත්තෑවේ දශකයේ මුල් භාගයේ කොළඹ හැව්ලොක් ටවුමේ ලුම්බිණී රඟහලේ වේදිකා ගත වූ සංගීත වේදී වික්ටර් රත්නායකයන්ගේ **ස** ප්‍රසංගයේ ප්‍රථම දර්ශණය දා සන්ධ්‍යාවේ දී ය. ඔහුගේ තබ්ලා වාදනයේ අපූර්වත්වය ගැන ප්‍රශංසාකරමින් මා ඔහු හා කතා කළේ මඳ වේලාවක් පමණි.

ඉන්පසු යළිත් මට විජේ හමුවූයේ ලන්ඩනයේ දීය. ඒ 1980 ජුනි මාසයේ එක්සත් රාජධානියේ සිංහළසංගමය විසින් සංවිධානය කරන ලද **ස** ප්‍රසංගයට වික්ටර් රත්නායකයන් සමග පැමිණ සිටි වාද්‍ය වෘන්දයේ ශිල්පීන් සමගය. ඔහු සමග සමීපව ඇසුරු කරන්නට ලන්ඩනයේ අප හා සිටින බොහෝ කලාකාමීන් හුරුවූයේ ඒ ගමනින් පසුව ය.

විජේරත්නයන්ගේ තබ්ලා වාදනයේ අපූර්වත්වය ලන්ඩනයේ වෙසෙන ලාංකිකයින්ට මුල් වරට දැනුණේ එදා වේදිකාවේ වික්ටර් **හෝපලු වනපෙත කම්පිත කර වන** නම් ගීය ගයද්දී ඊට තවත් ජීවය කවමින් විජේ තබ්ලාව වැයූ ආකාරය බලා සිටි විට ය. ප්‍රසංගය අවසානයේ වේදිකාවට ගිය රසික ජනතාව විජේට ප්‍රශංසා කළ අයුරු මම බලා සිටියෙමි.

ඉන්පසු විජේ නොයෙක් වතාවල ප්‍රසංග සඳහා ලන්ඩනයට පැමිණියේය. ඒ සැම විටකම පාහේ ඔහු මට හමු විය. වරක් මම ඔවුන් සමග ලන්ඩනයේ සිට ඉතාලියේ රෝම නගරයේ පැවති ගීත ප්‍රසංගයකට ද සහභාගිවීමට ගියෙමි. විජේ ඇතුළු ඒ කලාකාමී පිරිස සමග ගෙවූ දින කීපය ඉතා ආශ්වාදජනක ය.

ශ්‍රීලංකාවේ සිට එන විට ඔහු රැගෙන එන අපූර්ව හාස්‍යයෙන් පිරුණු කතාන්තර අප්‍රමාණය. ඒ සියල්ල එහි අපේ කලා ලෝකයේ අප හොඳින් දන්නා කලාකරුවන් පිළිබඳවය. ඒ කතා කියන කල ඔහුගේ මුහුණේ සිනා පොදක් නැත. ඉතා බරපතල පෙනුමකි. එහෙත් අසා සිටින අපට හිනාව නවත්වා ගන්නට බැරිය. ඔහු සිටිනා තැන විනෝද සාගරයකි.

ඔහු ගැන අවලාද හෝ දෝෂාරෝපණ වශයෙන් සංගීත ලෝකයේ කිසිවෙකු කතාකරනු මා අසා නැත. කිසිවිටක ඔහු කවුරුන් සමග හෝ උරණව සිටින අවස්ථාවක් හෝ කේන්තිගෙන සිටින අවස්ථාවක් හෝ අප දැක නැත. එසේ වුව ද ඔහු වරක් එක් අකටයුත්තක් පිළිබඳව ප්‍රවීන සංගීතඥයෙකුට දැඩිව කතා කළ අවස්ථාවක් ගැන මම දැන සිටිමි. ඔහුට කේන්ති ගොස් සිටි, මා දන්නා එකම දවස එය ය.

විජේගේ නිවුණු ගති පැවතුම් ස්වභාවයටම සරිලන ප්‍රේමනීය බිරිඳක් හා දරු දෙදෙනෙක් ඔහුට සිටිති. ඔහු සිය ජීවිතයේ ලද සැම දේකින්ම තෘප්තිමත්ව සිටියේ ය. වසර කීපය කට ඉහත මා ලංකාවට ගිය අවස්ථාවක නුගේගොඩදී මට විජේ හමුවිය. ඔහුගේ ඒ සුහදත්වයේ කිසිදු අඩුවක් නොවී ය.

දැන් ඔහු යන්නට ගොස් ඇත. ඔහු යළිත් අපට හමු නොවේ. එහෙත් ඔහුගේ රිද්මය අප සවනේ තබා ගියේ ය. දැනුත් එය ඇසේ !

♦ දයා ආනන්ද



ඒ **1982** අමරදේවයන් ඇතුළු පිරිස ලන්ඩනයට මුල් වරට ආ වර්ෂයයි. ස්ථානය- ලන්ඩනයේ හවුන්ස්ලෝහි වින්සන්ට් නාගහවත්තගේ නිවසයි.

වම් කෙළවරේ විජේරත්න රණතුංග තබ්ලාව වයයි. අමරදේව මාස්ටර් සර්පිනාව වයමින් **ඈත කඳුකර හිමව් අරණේ** ගීතය ගායනාකරයි. දකුණු පස සංගීතඥ ඩී. ඩී. ගුණසේන වයින් වීදුරුවක් අතැතිව අනික් අතින් මයික් එකක් අල්ලා ගීතය පටිගත කරයි. මැද සිටින්නේ මමය. මම අමරදේවයන්ගේ ඒ ආශ්වාදජනක මියුරු හඬ ඔස්සේ දැස් පියාගෙන නොදන්නා ඈත ලොවකට ගොස් සිටිමි. - *දයා* ( පින්තූරය ගත්තේ - තිස්ස මඩවල ය)

